## නියමයන් සහ කොන්දේසි - FriMi හරහා Flexi තැන්පතු සහ ස්ථාවර තැන්පතු

පහත සඳහන් නියමයන් සහ කොන්දේසි ගනුදෙනුකරුවන් විසින් FriMi හරහා විවෘත කිරීමට නියමිත Flexi තැන්පතු සහ ස්ථාවර තැන්පතු පාලනය කරනු ඇත.

**පහත "පිළිගනිමි" යන බොත්තම එබීමෙන්, ගනුදෙනුකරු පහත සඳහන් නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව ගණුදෙනු කිරීමට එකඟ වේ**

> **මෙම නියමයන් සහ කොන්දේසි, FriMi හරහා විවෘත කිරීමට නියමිත Flexi තැන්පතු සහ ස්ථාවර තැන්පතු නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සහ එම ගිණුම් ක්‍රියාත්මක කිරීමට අදාළ විස්තර සමඟ ගනුදෙනුකරුට පැහැදිලි කර ඇති බවත් ගනුදෙනුකරු මෙම නියමයන්, කොන්දේසි සහ එවැනි විස්තර කියවා තේරුම් ගෙන ඇති බවත් ඒ අනුව බැඳී සිටීමට එකඟ වන බවත් පිළිගෙන තහවුරු කරයි.**

### Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු විවෘත කිරීම

1. KYC සත්‍යාපනය සම්පූර්ණ කිරීම අනුව බැංකුව විසින් සක්‍රිය කර ඇති FriMi ඉතුරුම් ගිණුමක් ඇති ගනුදෙනුකරුවෙකුට Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත කළ හැක.
2. FriMi යෙදුම හරහා Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීමට ගනුදෙනුකරුවෙකු ඉල්ලීමක් ඉදිරිපත් කරන විට, ගනුදෙනුකරු විසින් බැංකුවට සපයන ලද නවතම KYC විස්තර භාවිතා කරමින්, ගනුදෙනුකරුගේ නමින් Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීමට ගනුදෙනුකරු සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.
3. Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම සඳහා අවම තැන්පතු මුදල රුපියල් 50,000 ක් වන අතර උපරිම තැන්පතු මුදලක් නොමැත. (අවම තැන්පතු මුදල කලින් කලට බැංකුව විසින් සංශෝධනය කළ හැක.)
4. Flexi තැන්පතුවක් විවෘත කළ හැකි අවම කාල සීමාව දින 30 ක් වන අතර උපරිම කාලය දින 365 කි. (බැංකුව විසින් අන්‍යාකාරයකින් සංශෝධනය නොකරන්නේ නම් මිස)
5. ස්ථාවර තැන්පතුවක් විවෘත කළ හැකි අවම කාල සීමාව මාස 1 ක් වන අතර උපරිම කාලය මාස 60 කි. (බැංකුව විසින් අන්‍යාකාරයකින් සංශෝධනය නොකරන්නේ නම් මිස)
6. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් ද බැංකුවේ සම්මත ස්ථාවර තැන්පතු පොලී අනුපාත සහ රජයේ බදු අදාළ වේ. පවතින පොලී අනුපාත පිළිබඳ FriMi යෙදුමෙන් උපදෙස් දෙනු ඇත.
7. Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීමේ මුදල් ශ්‍රීලං.රු.වලට සීමා කෙරේ.
8. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු තනි පුද්ගල ගිණුම් වලට සීමා කෙරේ.

### Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු මෙහෙයුම්

9. ඩිජිටල් ගිණුම් විවෘත කිරීමේ ආකෘතිය සම්පූර්ණ කර ගනුදෙනුකරු Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කළ පසු, තෝරාගත් මූලාශ්‍ර ගිණුමෙන් අවශ්‍ය අරමුදල් (තිබේ නම්) ස්වයංක්‍රීයව අඩු කර Flexi තැන්පතුවට හෝ ස්ථාවර තැන්පතුවට මාරු කරනු ලැබේ.
10. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු නිර්මාණය කළ පසු, ගකුදෙනුකරුට FriMi යෙදුම හරහා තැන්පතු තහවුරු කිරීමේ දැනුම්දීමක් ලැබෙනු ඇත.
11. තෝරාගත් මූලාශ්‍ර ගිණුමේ Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු වෙත මාරු කිරීමට ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැත්තේ නම්, Flexi තැන්පතුවක් හෝ ස්ථාවර තැන්පතුවක් විවෘත නොකරනු ඇත.
12. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු කල්පිරීමෙන් පසු Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු සඳහා පොලී ගෙවනු නොලැබේ.
13. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු වල ප්‍රාග්ධන සහ පොලී ගෙවීම් තෝරාගත් මූලාශ්‍ර ගිණුමට පමණක් මාරු කළ හැක්කේ ය.

**Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු අවසන් කිරීම**

14. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු කල්පිරෙන විට සහ Flexi තැන්පතුව හෝ ස්ථාවර තැන්පතුව කල් පිරීමට පෙර නිදහස් කරන අවස්ථාවකදී, Flexi තැන්පතුව හෝ ස්ථාවර තැන්පතුව නිර්මාණය කිරීමේදී තෝරාගත් මූලාශ්‍ර ගිණුමට අරමුදල් මාරු කරනු ලැබේ.
15. Flexi තැන්පතුව හෝ ස්ථාවර තැන්පතු තැන්පත් කළ දින සිට දින 30කට පෙර (ආරම්භ කළ දිනය ඇතුළුව නමුත් මුදල් බවට පත් කළ දිනය හැර) කල් පිරීමට පෙර මුදල් බවට පත් කරනු ලැබුවහොත්, ගනුදෙනුකරුට පොලී ගෙවනු නොලැබේ.
16. Flexi තැන්පතු හෝ ස්ථාවර තැන්පතු 15 වැනි වගන්තියේ සඳහන් කාල සීමාවෙන් පසුව කිසියම් වේලාවක කල් පිරීමට පෙර මුදල් බවට පත් කරනු ලැබුවහොත්, ගෙවිය යුතු පොලිය එකඟ වූවාට වඩා අඩු අනුපාතයකින් සහ බැංකුවේ අභිමතය පරිදි ගණනය කරනු ඇත.

**විවිධ**

17. මෙහි සඳහන් කර ඇති ප්‍රතිවිරුද්ධ වූ කිසිවක් නොසළකා, ගනුදෙනුකරුගේ Flexi තැන්පතුව හෝ ස්ථාවර තැන්පතුව සමඟ ගනුදෙනුකරු බැංකුව වෙත ඇති ඕනෑම වගකීමක් ඒකාබද්ධ කිරීමට සහ එවැනි වගකීම් සත්‍ය හෝ අවිනිශ්චිත ද, ප්‍රාථමික හෝ ඇපකර සහිත ද සහ තනි පුද්ගල හෝ ඒකාබද්ධ ද යන්න අනුව වෙනත් ඕනෑම ගිණුමක් මත හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් ගණුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු වෙනත් මුදලකට එදිරිව Flexi තැන්පතුවෙන් හෝ ස්ථාවර තැන්පතුවෙන් බැර කිරීමට යම් මුදලක්/තිරි කිරීමක් නියම කිරීමට හෝ මාරු කිරීමට ගනුදෙනුකරු සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පැවරීමයි.

18. ඕනෑම අවස්ථාවක මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතු වේ. එවැනි වෙනස්වීම් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් කරනු ඇත.

19. එවැනි සංශෝධන නීතියෙන් අවශ්‍ය වන්නේ නම් මෙම නියමයන් සහ කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වන්නේ ය.

20. මෙහි අන් ලෙසකින් නිර්වචනය කර නොමැත්තේ නම් මිස, ගනුදෙනුකරු විසින් දැනටමත් පිළිගෙන ඇති නියමයන් සහ කොන්දේසි වල ("ප්‍රධාන ගිවිසුම") දක්වා ඇති අර්ථයම ගනී.

21. මෙම නියමයන් සහ කොන්දේසි ප්‍රධාන ගිවිසුමේ විධිවිධාන සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර නියමයන් සහ කොන්දේසි (ඉල්ලීම මත ලබා ගත හැකි පිටපත්) සමඟ කියවිය යුතුය. එවැනි නියමයන් සහ කොන්දේසි මෙහි ඇතුළත් කර තිබේද නැද්ද යන්න නොසලකමින් ගනුදෙනුකරු එවැනි සියලුම නියමයන් සහ කොන්දේසිවලට බැඳී සිටී.

**අර්ථ දැක්වීම්**

**"බැංකුව"** යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. (PQ 118) අදහස් වේ.

**"Flexi තැන්පතුව"** යන්නෙන් අදහස් වන්නේ FriMi හරහා දින 30 සිට දින 365 දක්වා නිශ්චිත කාලයක් සඳහා තබා ඇති කාලීන තැන්පතු ගිණුමකි.

**"ස්ථාවර තැන්පතුව"** යන්නෙන් අදහස් වන්නේ FriMi හෝ බැංකුව හරහා නිශ්චිත කාලයක් සඳහා තැන්පත් කර ඇති කාලීන තැන්පතු ගිණුමකි.

**"KYC"** යන්නෙන් අදහස් වන්නේ ඔබේ ගනුදෙනුකරු දැන ගන්න යන්නය.

**"මූලාශ්‍ර ගිණුම"** යනු FriMi හි ගෙවීම් උපකරණයක් ලෙස ලියාපදිංචි කර ඇති නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. හි පවත්වාගෙන යන ගිණුමකි.